ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# මාධ්‍ය නිවේදනය

**<u>ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 40 දෙනෙකු සඳහා ඉන්දියාවේ දී ධාරිතා සංවර්ධන වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 40 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ඉන්දියාවේ යහපාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයේ (NCGG) පැවති පුළුල් ධාරිතා සංවර්ධන වැඩසටහනක් 2026 අගෝස්තු 21 වන දින සාර්ථකව අවසන් විය.

2. "ආපදා කළමනාකරණය" යන තේමාව යටතේ පැවති පස් වන විශේෂ පුහුණු වැඩසටහන මෙය වූ අතර මෙහි අරමුණ වූයේ ආපදා සූදානම, ප්‍රතිචාර, යථා තත්ත්වයට පත්වීම සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සේවා නිලධාරීන්ගේ ධාරිතාවයන් ශක්තිමත් කිරීමයි.

3. ආපදා සූදානම සහ හානි අවම කිරීමේ ක්‍රමෝපායන්, ආපදා කළමනාකාරණ සැලසුම් සහ ප්‍රතිපත්ති, ප්‍රතිචාර යාන්ත්‍රණ සහ ක්ෂේත්‍ර මෙහෙයුම්, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන්, නාගරික සහ ප්‍රාදේශීය ඔරොත්තු දීමේ හැකියාව, ආපදා කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ධාරිතාවය ගොඩනැගීම සහ අපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්දායි රාමුව වැනි මාතෘකා මෙම වැඩසටහන යටතේ ආවරණය කරන ලදී.

4. ශ්‍රී ලංකා කණ්ඩායම ජාතික ආපදා කළමනාකරණ අධිකාරිය, ජාතික ආපදා ප්‍රතිචාර බලකාය, උත්තරකාන්ඩ ප්‍රාන්ත ආපදා කළමනාකරණ අධිකාරිය සහ උත්තරකාන්ඩ ප්‍රාන්ත ආපදා ප්‍රතිචාර බලකාය වැනි ප්‍රමුඛ පෙළේ ආයතනවල නිරීක්ෂණ චාරිකාවන් හිද නිරත වූහ.

5. මෙම මුලපිරීම ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2024 වසරේ සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුරදී වසර 5ක් පුරා ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 1500 දෙනෙකු පුහුණු කිරීම සඳහා NCGG ආයතනය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ ක්‍රියාවට නංවන ලදී.

6. ධාරිතා සංවර්ධනය ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතාවයේ ප්‍රධාන අංගයකි. මෙම කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින් ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී

නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී අමතර වශයෙන් වාර්ෂිකව ශ්‍රී ලංකා වෘත්තිකයන් සඳහා විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බවට නිවේදනය කළේය. මේ අනුව ඉන්දියාවේ ධාරිතා සංවර්ධන ප්‍රයත්නය මගින් දැන් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000කට ප්‍රතිලාභ සැලසේ.

***

**කොළඹ**
***2026 අගෝස්තු 21***